# කාල සංකල්ප

අනෙකකු විසින් තමන් නිර්ණය කෙරෙනවා නොව තමන් විසින් තමන් නිර්මාණය කරනු ලැබෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය ද ඇතුළු වෙනත් දේව නිර්මාන මත පදනම්වන සංස්කෘතීන්ගෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය හා වෙනත් ථෙරවාදී බෞද්ධ සංස්කෘතීන් වෙනස්වන ප්‍රධානම කරුණ මෙය වෙයි. මාක්ස්වාදය ද ඇතුළු බටහිර නිර්මානය වී ඇති ඊනියා ද්‍රව්‍යවාදී මතවාද ද අවසාන වශයෙන් නිර්මානය වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය මත පදනම් වී බැවින් එහි ද මිනිසා, මිනිසා විසින් නොව ද්‍රව්‍ය විසින් නිර්මානය වන්නේ යැයි කියැවෙයි. ද්‍රව්‍ය නිර්මානය වන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට මාක්ස්වාදය පිළිතුරු නොදෙනමුත් ද්‍රව්‍යවාදී යැයි කියැවෙන බටහිර භෞතික විද්‍යාවෙහි ද්‍රව්‍ය හා විශ්වය ඉබේ ම නිර්මානය වන්නේ යැයි සැලකෙයි. මේ දෙවියන් වහන්සේ නැතිව එහෙත් යම් තැනකින් පටන්ගැනෙන ඒක රේඛීය නිර්මානයකි. එසේ නිර්මානය වන ද්‍රව්‍යයට ඊනියා ද්‍රව්‍යවාදයෙහි දේවත්වයක් ආරෝපනය කෙරෙන්නේ අන් සියල්ල අවසාන විග්‍රහයෙහි දී ද්‍රව්‍යයෙන් නිර්මානය වන බැවින් ය.

තමන් විසින් නිර්මානය කෙරෙන තමන්ට අනෙක් අයගේ බලපෑම් නැතැයි සිංහල බෞද්ධයෝ නො කියති. අනෙක් අය මෙන් ම ද්‍රව්‍ය නිසා ද තමන් යම් අයුරකින් වෙනස් කෙරෙන බව සිංහල බෞද්ධයෝ දනිති. එහෙත් තමන්ගේ මුල් නිර්මානය සිදුවන්නේ තමන් අතින් බවත් තමා යන හැඟීම සංසාර ගමනට හේතුව බවත් තමා යන හැඟීම නැතිකරගත හැක්කේ ද තමන්ට බවත් සිංහල ථෙරවාද බෞද්ධයෝ දනිති. තමන් යන හැඟීම නැතිකරගැනීම යන්නෙන් අදහස්වන්නේ තමා යන හැඟීම ඇතිකර ගැනීම වැරදි බව සංකල්පීය නොවන ආකාරයකට තේරුම්ගැනීමක් ය. එලෙස සංකල්පීය නොවන ආකාරයකට අවබෝධ කරගැනීම නිවන් අවබෝධය යැයි සිතිය හැකි ය.

තමා යන හැඟීම ඇතිකරගැනීම ම, මතකය හෙවත් තොරතුරු රැස්කරගැනීම හා වෙනස්වීම යන සංකල්ප මත පදනම් වෙයි. ඒ අරුතින් ගත්කල තමා යන සංකල්පය හා කාලය යන පඤ්ඤත්තිය එකිනෙක සමග අත්වැල් බැඳගෙන ඇත. ලෝකයේ අනෙක් අය හා වස්තු ගැන හැඟීමක් ඇතිවන්නේ තමන් ට ය. වෙනත් වචනවලින් කියන්නේ නම් අනෙකා නිර්මානය කෙරෙන්නේ තමා විසින් ය. එය ඊනියා පශ්චාත්නූතනවාදී අදහස් සමග ගැටෙයි. පශ්චාත්නූතනවාදී යැයි කියැවෙන මතවාදවලට අනුව තමා යන්න නිර්ණයවන්නේ අනෙකා අතින් ය. සිංහල බෞද්ධ සංස්කෘතික  දැනුම එයට විරුද්ධවන බව අපි දනිමු.

තමා යන සංකල්පය සමග කාලය යන පඤ්ඤත්තිය ද ඇතිවන බැවින් කාලය ගලාගෙන යන බවට හැඟීමක් පුද්ගලයකුට ඇතිවෙයි. පුද්ගලයකුගේ සිතැඟි හා ශාරීරික ලක්ෂණ වෙනස්වන බැවින් ඕනෑම පුහුදුන් පුද්ගලයකුට කාලය පිළිබඳ හැඟීමක් ද ඇතිවෙයි. එහෙත් මෙයින් කියැවෙන් ඒ ඒ පුද්ගලයන්ට ඒ ඒ සංස්කෘතිය මත පදනම් ව, කාලය යන පඤ්ඤත්තිය සඳහා වචනයක් තිබිය යුතු ය යන්න නො වෙයි. මිනිසා සැමදාමත් වචන කතාකළා නො වෙයි. එහෙත් වචන නැතිව වුවද මිනිසුන්ට තම හැඟීම් ගැන දැනුමක් ඇතිකරගත හැකි වෙයි.

මිනිසුන් චිත්‍ර අඳින්නේත් සංගීතයට සිත යොමුකරන්නේත් වචන ඇසුරෙන් පමණක් නො වෙයි. චිත්‍ර හා සංගීතය පැහැදිලිව ම මිනිසා භාෂාවක් ඇතිකර ගැනීමට පෙරම සිදු වී ඇති කාර්යයන් වෙයි. හැඟීම් සංකල්ප ආදිය ඇතිවීමට හෝ ඇතිකිරගැනීමට හෝ හෝ වචන අවශ්‍ය ම නො වෙයි. කාලය යන සංකල්පය හෝ වෙනත් සංකල්පයක් හෝ වචන නැතිව වුව ද නිර්මානයකර ගත හැකි ය. මිනිසුන් සංගීතය නිර්මානය කරන්නට ඇත්තේ භාෂාව නිර්මානයකිරීමට පෙර බැවින් ඒ ඒ භාෂාවන් අනුව සංගීතය ඇතිවුණා නොව ඒ ඒ සංගීතය අනුව පළමුව භාෂාව ඇතිවිණි යැයි සිතීමට හැකි ය. ඒ අර්ථයෙන් ගත්කල භාෂාවේ අවසානයේ සංගීතය ඇත යන්න හිස් ප්‍රලාපයක් පමණක් වෙයි.

කෙසේ වෙතත් වෙනත් තැනැත්තකුගේ, එනම් අන් අයකුගේ ආධාරයක් නොමැතිව පුද්ගලයකු කාලය නමින් හැඳින්වෙන සංකල්පය නිර්මානය කරගන්නා බව මේ සියල්ලෙන් පැහැදිලි වෙයි. එබැවින් එකිනෙකාගේ කාල ද

© Prof. Nalin De Silva

වෙනස්විය යුතු ය. එනම් ඒ ඒ කාල සංකල්ප නිරපේක්ෂයක් විය යුතු නො වෙයි. අප මෙහි දී අයින්ස්ටයින් විද්වතාගේ කාලය හා අවකාශය පිළිබඳ සාපේක්ෂතාවාදයෙන් ද ඔබ්බට යන බව තේරුම්ගත යුතු ය.
සාපේක්ෂතාවාදයෙහි දී කාලය හා අවකාශය එක් එක් නිරීක්ෂකයාට සාපේක්ෂකය යන්නෙන් අදහස් කෙරෙන්නේ ඒ ඒ නිරීක්ෂකයාට සිද්ධි දෙකක් අතර දුර හා කාල ප්‍රාන්තරය සම්බන්ධයෙන් වෙනස් මිනුම් ඇතිකරගත හැකිය යන්න ය. එහෙත් ඒ ඒ නිරීක්ෂකයා කාලය හා අවකාශය සම්බන්ධයෙන් ඇතිකරගන්නා සංකල්පය එකක්ම යැයි එහි දී උපකල්පනය කෙරෙයි. බටහිර භෞතික විද්‍යාව මූලික වශයෙන්ම විවිධ මිනුම් පිළිබඳ විද්‍යාවක් හෙයින් එහි දී මිනුම්වල සාපේක්ෂතාව හැරෙන්නට වෙනත් සාපේක්ෂතාවක් ගැන කතා නොකෙරෙයි. එහි දී අවශ්‍ය වන්නේ ඒ ඒ නිරීක්ෂකයා ලබාගන්නා මිනුම් සංසන්දනය කිරීමේ දී කුමක් කළ යුතු ද යන්න ය. සංකල්පවල සාපේක්ෂතාවක් එහි දී සාකච්ඡා නො කෙරෙයි. සෑම නිරීක්ෂකයකුට ම කාලය පිලිබඳ එකම සංකල්පයක් ඇතැයි එහි දී උපකල්පනය කෙරෙයි.

අයින්ස්ටයින් විද්වතාගේ සාපේක්ෂතා ප්‍රවාදය නිව්ටෝනීය හෙවත් ගැලීලීය සාපේක්ෂතාවෙන් ඔබ්බට ගිය එකක් බව පිළිගත යුතු ය. ගැලීලීය සාපේක්ෂතාවෙහි ඒ ඒ නිරීක්ෂකයාට සාපේක්ෂව වස්තුවක ප්‍රවේගය වෙනස්විය හැකි ය. එහෙත් එහි දී ඒ ඒ නිරීක්ෂකයාට සාපේක්ෂව සිද්ධි දෙකක් අතර කාල ප්‍රාන්තර හා දුර වෙනස් නො වෙයි. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවෙහි ඒ කාල ප්‍රාන්තර හා දුර ද වෙනස්විය හැකි නමුත් ඒ පිළිබඳ සංකල්ප එකම යැයි උපකල්පනය කෙරෙයි. අප මෙහි දී කරන්නේ ඒ සංකල්ප පවා සාපේක්ෂ විය හැකියැයි ගැනීම ය.

ඒ ඒ නිරීක්ෂකා ඇතිකරගන්නා සංකල්ප වෙනස් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. භාෂාවක් නිර්මානය කිරීමට පෙර මේ සංකල්ප සාපේක්ෂතාව බෙහෙවින් තිබෙන්නට ඇත. භාෂාවක එක අරමුණක් වන්නේ ද හැකිතාක් යම් භාෂාවක් කතාකරන ජනතාව අතර මේ සංකල්ප සාපේක්ෂතාව නැතිකිරීම ය. එසේ වුවත් ඒ නැතිකිරීම අපහසු ය. භාෂා දෙකක් අතර ඇති වෙනස්කම් ගැන අපි දනිමු.  සිංහලෙන් අම්මා කී විට ඇතිවන හැඟීම ඉංගිරිසියෙන් මමී කී විට ඇතිවන හැඟීමට වඩා වෙනස් ය. අපි ඒ බව කලින් සාකච්ඡාකර ඇත්තෙමු. එක් භාෂාවකින් වෙනත් භාෂාවකට පරිවර්තනයකිරීමේ දී පළමු භාෂාවේ වචනයකින් යම් සන්දර්භයක දෙන අදහස දෙවැනි භාෂාවෙන් කීමේ දී පරිවර්තකයෝ මේ ප්‍රශ්නයට මුහුණ දෙති.

එහෙත් එකම භාෂාවක වුව ද එක් එක් වචනවලින් එක් එක් නිරීක්ෂකයා පළකරන හෝ අදහස්කරන හෝ තේරුම එකම නොවිය හැකි ය. ප්‍රාදේශීය වශයෙන් ගතහොත් ඇතැම් පළාත්වල සිංහලෙන් නැන්දම්මා යන්නෙන් වෙනත් පළාත්වල නැන්දා යන්නෙන් අදහස්වන්න කියැවෙයි. ඒ අනෙක් පළාත්වල නැන්දම්මා යනුවෙන් අදහස්කෙරෙන්නේ සැමියාගේ හෝ භාර්යාවගේ හෝ මව පමණ ය. ඒ ප්‍රාදේශීය වෙනස්කම් නැතිව වුව ද එකම ප්‍රදේශයක පවා එකම වචනයකින් විවිධ පුද්ගලයෝ විවිධ දේ අදහස්කරති.

උදාහරණයක් ලෙස අනිවාර්ය යන වචනය ගනිමු.  අද මේ වචනය බොහෝ දෙනකු යොදාගන්නේ නිශ්චිතවම යන අර්ථයෙන් ය. ඇතැමුන් අනිවාර්යයෙන්ම මා අද පාසල් යනවා යැයි කියන විට ඉන් අදහස්කරන්නේ ඔවුන්ට පාසල්යෑම අනිවාර්ය නිසා එසේ යන බව නොව නිශ්චිත වශයෙන්ම ඔවුන් පාසල් යන බව ය. එහෙත් වෙනත් අයට අනිවාර්ය යන්නෙන් ලැබෙන අදහස එය නො වෙයි. අද අනිවාර්ය යන වචනයෙහි තේරුම සමාජයෙහි වෙනස් වෙමින් පවතියි. අනාගතයේ දී ඇතැම් විට අනිවාර්ය යන්නට නිශ්චිත යන අර්ථය සමාජය විසින් දෙනු ලැබෙනු ඇත. එහෙත් අද අනිවාර්ය  යන වචනයෙන් සමාජයේ අඩුම තරමින් අදහස් දෙකක් ගම්‍යවන බව පෙනී යයි.

භාෂාවක මෙවැනි දුර්වලතා තිබෙන නිසාම ගණිතයෙහි දී වචනවලට නිශ්චිත අර්ථදීමට මහත් උත්සාහයක් ගනු ලැබෙයි. ගණිතය අනෙක් විෂයන්ගෙන් වෙනස්වන ප්‍රධාන ම කරුණක් වන්නේ මේ නිශ්චිත බව ය. නීතියෙහි ද වචනවලට නිශ්චිත තේරුම්දීමට උත්සාහකෙරෙන  මුත් ඒ කාර්යය එහි දී ගණිතයෙහි තරමට ඉටුවන බවක් නො පෙනෙයි. එයට ප්‍රධාන හේතුව වන්නේ නීතියෙහි දී  සාමාන්‍ය භාෂාවේ වචන ම යොදාගැනීම ය. අනෙක් අතට ගණිතයෙහි දී එයටම ආවේණික වූ භාෂාවක් යොදාගැනීමට හැකි සෑම උත්සාහයක් ම දරනු පෙනීයයි.

© Prof. Nalin De Silva

කාලය සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන්ට තිබිය හැකි විවිධ සංකල්ප භාෂාව ඔස්සේ නැතිකිරීමට උත්සාහ ගත්ත ද, පුද්ගලයන් අතර ඒ පිළිබඳ විවිධ අදහස් තිබිය හැකි ය. අයින්ස්ටයිනීය සාපේක්ෂතා ප්‍රවාදයෙහි පවා එලෙස සංකල්පීය වෙනස්කම් ඇති බව නො පිළිගැනෙයි.

ඒ ඒ පුද්ගලයාට කාලය සම්බන්ධයෙන් සංකල්පීයව විවිධ අදහස් තිබෙය යන්න පිටුපස ඒ ඒ පුද්ගලයා අනෙකාගෙන් තොරව කාලය යනුවෙන් සංකල්පයක් නිර්මානය කරගන්නා බව ද කියැවෙයි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති දැනුමට අනුව කාලය යනුවෙන් සංකල්පයක් ඇතිකරගැනීමට අවශ්‍ය වනුයේ මතකයක් හා වෙනස්වීම යන අදහස ඇතිකරගන්නා විඥානයක් සහිත සත්ත්වයකු පමණකි. එවැනි සත්ත්වයන්ට කාලය යනුවෙන් යම්කිසි සංකල්පයක් නිර්මානයකරගැනීමේ බාධාවක් නැත.

එහෙත් ප්‍රශ්නයවනුයේ එවැනි විඥානයක් නොමැති සත්ත්වයන් සම්බන්ධයෙන් ය. සංකල්පයක් නිර්මානයකරගැනීමට තරම් විඥානයක් නොමැති සත්ත්වයන් හා ද්‍රව්‍ය සම්බන්ධයෙන් කාලය යනුවෙන් යමක් පවතින්නේ ද ? අංශු හා වස්තු පමණක් නොව ප්‍රති අංශු හා ෆෝටෝන සම්බන්ධයෙන් ද කාලය ගැන කිවහැක්කේ කුමක් ද? අංශු, ප්‍රති අංශු ෆෝටෝන ආදියට විඥානයක් නොමැති හෙයින් කාලය පිළිබඳ සංකල්පයක් ඇතිකරගැනීමට නොහැකි ය. එහෙත් ඒ නොයෙකුත් අංශුවලට හා ෆෝටෝනවලට මතකයක් තිබේ යැයි අපට සිතාගත හැකි ය.

මෙහි දී මතකයක් යනුවෙන් අදහස්කරන්නේ කුමක් ද යන ප්‍රශ්නයට පළමුවෙන් ම පිළිතුරක් සොයාගත යුතුවෙයි. අංශුවක හෝ පරමාණුවක හෝ මතකය යනු කුමක් ද? අංශුවලට හා වස්තුවලට මතකයක් යනුවෙන් සංකල්පයක් නැති නමුත් සාමාන්‍ය වස්තුවකට එක් තැනක සිට තවත් තැනකට යා හැක්කේ අනාගතයේ දී මිස අතීතයේ දී නොවන බව අපි දනිමු. ඒ එසේ වන්නේ කෙසේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva